සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය
Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone

**ගම්පහ අධ්‍යාපන කලාපය**
Gampaha Education Zone

**දෙවන වාර ඇගයීම - 2025**
Second Term Evaluation - 2025

| | | | | | |
|---|---|---|---|---|---|
| ශ්‍රේණිය Grade | 7 | විෂයය Subject | **ඉතිහාසය** | කාලය Time | පැය 02 |

## I කොටස

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. අතීතයේදී හේනක් හැඳින්වීමට ''පිටබිම්'' යන වචනය යොදාගන ඇති මූලාශ්‍රය වන්නේ,

(1). උම්මග්ග ජාතකය (2). මහාවංසය
(3). සෙල්ලිපි (4). දීපවංසය

02. කන්න තුනක් යටතේ වී වගා කළ බව සඳහන් වන පුරාණ සෙල්ලිපිය වන්නේ,

(1). තෝනිගල සෙල්ලිපිය (2). ඉරිපින්නියාව සෙල්ලිපිය
(3). බදුලු ටැම් ලිපිය (4). වේවැල්කැටිය ශිලා ලිපිය

03. වෙළඳාමට සම්බන්ධ ගම් හැඳින්වූයේ,

(1). කසීකාරගාම (2). කුම්භකාර ගාම (3). පට්ටනගම් (4). නියම්ගම්

04. රුවන්වැලිසෑය සැරසීමට රෝමයෙන් පබලු ගෙන්වා ගත් රජතුමා වන්නේ,

(1). දුටුගැමුණු රජු (2). භාතිකාභය රජු
(3). දේවානම්පියතිස්ස රජු (4). හතරවන උදය රජු

05. ''මධුපාචිකා'' යනුවෙන් පැරණි මූලාශ්‍රය වල සඳහන් කර ඇත්තේ,

(1). සූපශාස්ත්‍රයට දක්ෂ කාන්තාවන්ය.
(2). සටන් කලාවට දක්ෂ කාන්තාවන්ය.
(3). විලාසිතාවට දක්ෂ කාන්තාවන්ය.
(4). නිවසේ වැඩ කටයුතු වලට දක්ෂ කාන්තාවන්ය

06. පළමුවන සේන රජුගේ පාලන සමයේ ලංකාවට ආක්‍රමණයක් එල්ල කළ පාණ්ඩ්‍ය රජු වන්නේ,

(1). පළමුවන වරගුණවර්මන් රජු (2). පළමුවන රාජරාජ රජු
(3). ශ්‍රී මාර ශ්‍රී වල්ලභ රජු (4). පළමුවන රාජේන්ද්‍ර රජු

07. රාජ්‍ය පාලන කටයුතු වලදී අනාගත රජකම උරුම තැනැත්තා හැඳින්වූයේ,

(1). ඈපා (2). මාපා (3). පොචනි රජ (4). යුවරජ

08. පාණ්ඩ්‍ය රාජ්‍යයේ අගනුවරය වූයේ,

(1). මදුරාපුරය (2). කාංචිපුරය (3). තන්ජෝරය (4). දිල්ලිය

09. පනාකඩුව තඹ සන්නස හා සම්බන්ධ රජු වන්නේ,

(1). පළමුවන විජයබාහු රජු (2). නිශ්ශංකමල්ල රජු

(3). මහා පරාක්‍රමබාහු රජු (4). වංකනාසික තිස්ස රජු

10. තුළාභාර දානය දුන් රජු වනුයේ,

(1). පළමුවන විජයබාහු රජු (2). නිශ්ශංකමල්ල රජු

(3). මහා පරාක්‍රමබාහු රජු (4). මානවම්ම රජු

- **11 සිට 15 දක්වා ප්‍රශ්න වලට සුදුසු පිළිතුර වරහන තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න.**

**(මහා පරාක්‍රමබාහු රජු, බුද්ධදාස රජු, පෙර සිරිත, ගමික, පළමුවන විජයබාහු රජු)**

11. කලින් රජවරු අනුගමනය කළ පිළිගත් ප්‍රතිපත්තිය ………………………………..

12. ගම් පාලනය කළ පිරිස හඳුන්වා ඇත්තේ ………………………..

13. සෑම ගම් දහසකටම වෛද්‍යවරයෙකු පත් කළ රජු ………………………………..

14. පොළොන්නරුවේ තෙමහල් දළඳා මාලිගයක් ඉදිකල රජු ………………………….

15. පොළොන්නරු කතිකාවත පිහිටුවීමට පුරෝගාමී වූ රජතුමා ……………………………….

- **16 සිට 20 දක්වා ප්‍රශ්න හරි නම් (✓) ලකුණද, වැරදි නම් (×) ලකුණද යොදන්න.**

16. පේෂ කර්මාන්තයේ නියැලුන පුද්ගලයින් පෙහෙකාර නමින් හැඳින්විය. (    )

17. කුරක්කන්, මෙනේරි කටුසර බෝග ලෙස සැලකේ. (    )

18. කුට්ඨක සෙන්පතියා පළමුවන සේන රජුගේ දක්ෂ සෙන්පතියෙකි (    )

19. උතුරු පළාතේ කුඹුරක තිබී පනාකඩුව තඹ සන්නස හමුවිය. (    )

20. අලුතින් ගිනි තබා සකස් කළ හේන නවදැලි හේනක් ලෙස හැඳින්වේ. (    )

(ල.40)

## II කොටස

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **අනෙකුත් ප්‍රශ්න අතරින් හතරකට පිළිතුරු සපයන්න.**
- **පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.**

01. A හා B දක්වා ඇති පින්තූර ඇසුරින් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



A රූපය

(i). රූපයේ දැක්වෙන උපකරණය කුමක්ද ?

(ii). එය භාවිතා කලේ කුමන කර්මාන්තයක් සඳහාද?

(iii). මෙම කර්මාන්තයේ නිරත ශිල්පීන් හඳුන්වන නම ලියන්න.

(iv). මෙම උපකරණය මගින් නිපදවන භාණ්ඩ දෙකක් ලියන්න.



B රූපය

(i). මෙම පින්තූරයෙන් දැක්වෙන්නේ කුමක්ද ?

(ii). මෙය ලියවූයේ කිනම් රජ සමයේද ?

(iii). මෙම ලියවිල්ල හා සම්බන්ධ සෙන්පතියා කවුද ?

(iv). මෙය හමුවූයේ කුමන පළාතෙන්ද ?

(ල.2x8=16)

02. (i). අතීත ජනතාවගේ ප්‍රධාන ජීවනෝපාය වෘත්තීන් දෙකක් ලියන්න. (ල.2)

(ii). a). හේන්වල වගා කළ ඇල් වී වර්ග දෙකක් ලියන්න.

b). හේන් වගාවට යොදාගත් සරල උපකරණ දෙකක් ලියන්න.

(ල.2x2=4)

(iii). a). තෝනිගල සෙල්ලිපියේ සඳහන් වී වගා කළ කන්න තුන නම් කරන්න.

b). අතීතයේ වී වගාව ආරක්ෂා කර ගැනීමට අනුගමනය කළ සාම්ප්‍රදායික ක්‍රම දෙකක් ලියන්න. (ල.5)

03. (i). මින්නේරි දෙවියන් ලෙස ප්‍රසිද්ධ රජු කවුද ? (ල.2)

(ii). a). ''කිරිගෙරි'' ලෙස අතීතයේ හඳුන්වා ඇත්තේ කවුරුන්ද ?

b). පස්ගෝ රස වලින් වර්ග දෙකක් ලියන්න.

(ල.4)

(iii). අතීතයේ අපේ රටේ පැවැති වෙළෙඳාම පිළිබඳව කරුණු පහක් ලියා දක්වන්න. (ල.5)

04. (i). මාගම සිට අනුරාධපුරයට යන ගමනේ දී සුවඳ විලවුන් මිලදී ගත් බව සඳහන් තැනැත්තා කවුද ? (ල.2)

(ii). අතීතයේ සිට ඉතා දියුණු විදේශ සබඳතා පැවැත් වූ රටවල් හතරක් ලියන්න. (ල.4)

(iii). a). බදුලු ටැම් ලිපිය කරවූ රජතුමා ලියන්න.

b). එහි සඳහන් නීති රීති තුනක් ලියන්න. (ල.5)

05. (i). ශ්‍රමයට ශ්‍රමය හුවමාරු කර ගැනීම හඳුන්වන නම ලියන්න. (ල.2)

(ii). අනුරාධපුර යුගයේ බහුලවම පැවති රාජ්‍ය උරුම වීමේ ක්‍රම දෙකක් ලියන්න. (ල.4)

(iii). a). පළමුවන විජයබාහු රජු පිළිබඳව හැදෑරීමේදී වැදගත් වන මූලාශ්‍රය දෙකක් ලියන්න.

b). පළමුවන විජයබාහු රජුගේ ආගමික සේවාවන් තුනක් ලියන්න. (ල.5)

06. (i). මහා පරාක්‍රමබාහු රජු විසින් ජලය සම්බන්ධව කළ විශේෂ ප්‍රකාශය ලියන්න. (ල.2)

(ii). a). පොළොන්නරුවේ පරාක්‍රම සමුද්‍රය නිර්මාණයට යොදා ගත් වැව් දෙකක් ලියන්න.

b). දෙවනගල සෙල්ලිපියේ සඳහන් තොරතුරක් ලියන්න. (ල.4)

(iii). a). නිශ්ශංකමල්ල රජු මුහුණදුන් අභියෝග තුනක් ලියන්න.

b). රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී අනුරාධපුර යුගයේ රජවරු විශේෂ සැලකිල්ලක් දැක්වූ කරුණු දෙකක් ලියන්න. (ල.5)

07. (i). ස්පෘශ්‍ය උරුම යනු මොනවාද ? (ල.2)

(ii). ශ්‍රී ලංකාවේ පිහිටා ඇති ලෝක උරුම හතරක් ලියන්න. (ල.4)

(iii). සීගිරිය බලකොටුවක් මෙන්ම විශිෂ්ඨ කලාගාරයකි. මෙලෙස නම් කිරීමට හේතු තුනක් ලියා එකක් විස්තර කරන්න. (ල.5)